NILIS

# පුස්තකාලයාධිපතිත්ව උසස් සහතිකපත්‍ර පාඨමාලාව

## Advanced Certificate in Librarianship (පාඨමාලා කේතය: ACL)

ACL 2024

### 1) හැදින්වීම

පුස්තකාලයාධිපතිත්ව උසස් සහතිකපත්‍රය (ACL) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) 02 මට්ටමට අනුකූලව පිරිනමනු ලබන අතර, සහභාගිවන්නන්ගේ පුස්තකාලයාධිපතිත්ව දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරිම අරමුණු කර ගෙන සැලසුම් කර ඇත. ACL පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරිම අපගේ (SLQF 3 මට්ටමෙහි) ඩිප්ලෝමා පාඨමාලාවකට ඇතුලත්වීමට සුදුසුකමක් ලෙස ද සැලකේ.

### 2) ඉලක්ක කණ්ඩායම

අ.පො.ස.(සා.පෙළ) සමතුන් සහ පුස්තකාල පිළිබඳ කෙටි කාලීන පුහුණුවක් පමණක් අවශ්‍ය අයවලුන් සඳහා.

### 3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්

පාඨමාලාවට ඇතුළත් වීමට අවශ්‍ය අවම සුදුසුකම

- **අ.පො.ස.(සා.පෙළ) (පැරණි විෂය නිර්දේශය):** මව් භාෂාව සහ ගණිතය ඇතුළුව මූලික විෂයයන් හයක් සමත් වීම සහ අවම වශයෙන් (ඕනෑම) විෂයයන් තුනක් සඳහා සම්මාන සාමාර්ථ (C) හෝ ඉහළ ශ්‍රේණි ලබා තිබීම.
- **අ.පො.ස.(සා.පෙළ) (2007-නව විෂය නිර්දේශය)**: මව් භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයක් සමත් වීම සහ අවම වශයෙන් (ඕනෑම) විෂයයන් තුනක් සඳහා සම්මාන සාමාර්ථ (C) හෝ ඉහළ ශ්‍රේණි ලබා තිබිම.
- ඉහත ප්‍රතිඵල දෙවතාවකදී ලබා තිබිය හැකිය.
- මෙම ප්‍රතිඵල දෙවතාවකදී ලබා ඇත්නම්, පළමු වරදී මව් භාෂාව සහ ගණිතය ඇතුළු මූලික විෂයයන් පහක් සමත් වි තිබිය යුතු අතර අවම වශයෙන් (ඕනෑම) විෂයයන් තුනක් සඳහා සම්මාන (C) හෝ ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතුය.

### 4) ඉගෙනුම් ඵල

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව,

- විවිධ අවශ්‍යතා සහ අරමුණු සහිත පුද්ගලයන්ට සේවය කිරීම සඳහා පුස්තකාල ක්‍රියාත්මක වන ආකාරය නිදර්ශනය කිරීමට
- සාමාන්‍ය පුස්තකාල කාර්යයන් සම්පූර්ණ කිරීමට
- ප්‍රධාන තොරතුරු මූලාශ්‍ර හඳුනාගැනීමට
- මූලික සන්නිවේදනය සහ තොරතුරු ලබා ගැනීම සඳහා ICT සහ ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමට
- කියවීම ප්‍රවර්ධනය කිරීමට
- පුස්තකාල බාහිර ක්‍රියාකාරකමක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට

සහභාගිවන්නාට හැකි වනු ඇත

5) **වැඩසටහනේ වැදගත්කම:** ඔබ අ.පො.ස./උ.පෙ සම්පූර්ණ කර නොමැති නම්, ACL පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූප සටහනේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන (SLQF Level 3) ඩිප්ලෝමා පාඨමාලා තුනෙන් එකකට ඇතුලත් වී උසස් ඩිප්ලෝමාව (SLQF Level 3) දක්වා ඉදිරියට යාමට හැකි වේ.




6) **පාඨමාලාවට අන්තර්ගත විෂයයන්**

i. වෘත්තීය අධ්‍යයනය සඳහා සූදානම් වීම (තොරතුරු හා සන්නි
   තාක්ෂණ සහ ඉංග්‍රීසි)
ii. පුස්තකාලය පිළිබඳ හැඳින්වීම
iii. එකතුව සංවර්ධනය සහ කළමනාකරණය
iv. තොරතුරු සේවා
v. පුස්තකාල වර්ග
vi. ව්‍යාපෘතිය

7) **පාඨමාලා කාලය :** මාස 06 (දේශන වැඩි ප්‍රමාණයක් මාර්ගගතව පැවැත්වේ).

8) **මාධ්‍ය -** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).

9) **ඇගයීම් ක්‍රමවේදය:** සෑම විෂයක් සඳහාම ලබාදෙන ඇගයීම් ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම මගින්.

10) **පුස්තකාලයාධිපතිත්ව සහතිකපත්‍රය ලබා ගැනීමට නම්**
පුස්තකාලයාධිපතිත්ව සහතිකපත්‍රය ලබා ගැනීමට නම් පාඨමාලාලාභීන් සෑම විෂයයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය.

11) **පාඨමාලා ගාස්තු:** රු.25,000/= ( එක් වාරිකයකින් ගෙවිය යුතුය).

12) **තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ: 2024 ජනවාරි 6 වැනි දින පෙ.ව. 9.30ට**

13) **වැඩසටහන් ආරම්භය: 2024 පෙබරවාරි මස.**

14) **අයදුම් කරන ආකාරය**

i. අපගේ වෙබ් අඩවියෙන් (https://nilis.cmb.ac.lk/home/course/advanced-certificate-in-librarianship/) අයදුම්පත බාගත කරන්න.
ii. අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න.
iii. උප්පැන්න සහතිකයේ, අධ්‍යාපන සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත් අමුණන්න.
iv. මහජන බැංකුව, තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100101191736 දරන ගිණුමට අයදුම්පත් සැකසීමේ ගාස්තුව ලෙස රු.300.00 ගෙවා, රිසිට් පත අයදුම් පතෙහි අදාළ කොටුවේ අලවන්න.
v. **උප්පැන්න සහතිකය, ජා.හැඳුනුම් පත සහ අධ්‍යාපන සහතික වල මුල් පිටපත් සහ සහතික කරන ලද පිටපත් රැගෙන , 2024 ජනවාරි 06 වැනි දින පෙ.ව.9.30ට අප ආයතනයට පැමිණෙන්න.**

"නියෝජ්‍ය **ලේඛකාධිකාරී**
ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03"
දුරකථන: 011 2507150 / 0714434638